# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිඳු ජයවර්ධන
176/3,
ඔරුතොට,
ගම්පහ

අභියාචක

අභියාචනා අංකය :
RTIC Appeal/355/2022

එදිරිව

ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පොදු අධිකාරිය

ඉදිරිපිටදී : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම් නහියා - කොමසාරිස්

පෙනී සිටීම : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක බුද්ධික ඔෂාන් මයා පෙනී සිටී.

ලිඛිත සැළකිරීම් : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

විභාග කළ දිනය : 2022.11.09

තීරණය කළ දිනය : 2022.11.09

**කොමිෂන් සභාවේ තීරණය:**

අභියාචනයට පසුබිම්වූ කරුණු

අභියාචක විසින් 2022.09.19 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

"තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 25(3) වගන්තිය යටතේ මෙම තොරතුරු ඉල්ලීම යොමු කරමි. මෙම තොරතුරු ඉල්ලීමට අදාළ වන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතාගේ ජීවිතයට හා පෞද්ගලික නිදහසට මෙම කාරණය සෘජුවම අදාළ බැවින් පනතේ 25 (3) ප්‍රතිපාදන යටතේ මෙම ඉල්ලීම ඉදිරිපත් කරමි.

1) ශානි අබේසේකර මහතාගේ ජීවිතයට තර්ජනයක් ඇති විය හැකි බැවින් ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දෙන ලෙස දැනුම් දෙමින් වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය පොලිස්පති වෙත යොමු කල ලිපියේ සහතික පිටපත් ලබා දෙන්න.

2) එම ලිපිය සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති කමල් සිල්වා සිය නිරීක්ෂණ ලබා දුන් ලිපියේ සහතික පිටපත් ලබා දෙන්න.

3) එම කරුණය සම්බන්ධයෙන් එනම් අබේසේකර මහතාට අවශ්‍ය ආරක්ෂාව සපයන ලෙස දන්වමින් පොලිස්පතිවරයා විසින් බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට යොමු කළ ලිපියේ සහතික පිටපතක් ලබා දෙන්න.

4) මෙම කාරණය සම්බන්ධයෙන් එනම් අබේසේකර මහතාට ආරක්ෂාව ලබා නොදී, ඒ වෙනුවට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පැතූ බව සඳහන් කරමින් බස්නාහිරට පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා, පොලිස්පතිවරයාට යවන ලද ලිපියේ සහතික පිටපතක් ලබා දෙන්න.

5) පොලිස්පතිවරයාගේ ලිපිය මත බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා අවශ්‍ය ආරක්ෂාව නොදීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය දැනුවත් කර තිබේද? තිබේනම් ඊට අදාල ලිපියේ සහතික පිටපතක් ලබා දෙන්න.

6) ශානි අබේසේකර මහතාගේ ආරක්ෂාව වෙනුවෙන් පොලිස් දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන තිබේද? තිබේ නම් ඊට ලේඛනවල පිටපත් ලබා දෙන්න.

7) නොතිබේ නම්, ඊට අදාල ලේඛනවල පිටපත් ලබා දෙන්න."

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.09.22 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරියා විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.09.29 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

අභියාචකගේ 2022.09.19 දිනැති තොරතුරු ඉල්ලීමට සහ 2022.09.22 දිනැති අභියාචනයට ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි විධිවිධානවලට අනුකූලව, පනත මගින් නිශ්චිතව දක්වා ඇති කාල නියමයන් තුළ පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා සඳහා ප්‍රතිචාර දැක්වීමට, පනතෙහි 24 (3) සහ 25 (1) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හටද, පනතෙහි 31(2) සහ 31(3) වගන්ති ප්‍රකාරව නම්කළ නිලධාරියා හට ද පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා සහ නම්කළ නිලධාරියා විසින් පැහැර හැර ඇත.

**සළකා බැලීම**

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද උක්ත තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන් පසුව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයටද පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දක්වා නොමැත. මෙම තත්වය පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන බරපතල ලෙස උල්ලංඝනය කිරීමකි.

උක්ත පනතේ 24, 25, 27 සහ 28 වන වගන්ති යටතේ තොරතුරු නිලධාරි විසින් තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදීත් එකී විධිවිධාන පරිදි ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ. එසේම, අභියාචනය ඉදිරිපත් කළ පසු නම් කළ නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ආකාරය පනතේ 31 වන වගන්තිය යටතේ පැහැදිලිව දක්වා තිබියදීත් ඒ පිළිබඳව ක්‍රියා කළ බවට කරුණු අනාවරණය නොවේ.

මේ අන්දමින් තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම් කිසිසේත් සැහැල්ලුවෙන් සැළකීමට කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි විසින් 2016 අංක 12 දරණ පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාවට නැංවීමට අසමත් වන්නේ නම් ඔවුනට එරෙහිව උක්ත සඳහන් පනතේ 38 වන වගන්තිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට සිදු වේ. එබැවින් මින් ඉදිරියට තොරතුරු පනතේ විධිවිධාන උල්ලංඝනය වීම් වළක්වා ගැනීම සඳහා පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තරයේ අවධාරණය කරයි.

මේ අනුව තොරතුරු මුදා නොහැරීම සම්බන්ධයෙන් කිසිදු ස්ථාවරයක් ඉදිරිපත් කිරීමට පොදු අධිකාරිය සමත් නොවේ. අද දින පරීක්ෂණයට උප පොලිස් පරීක්ෂක බුද්ධික ඔෂාන් සහභාගි වී ඇතත් තොරතුරු පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින තොරතුරු නිලධාරි සහ නම් කළ නිලධාරි යන දෙදෙනා නියෝජනය කරමින් කරුණු පැහැදිලි කිරීමට තරම්වත් උසස් නිලධාරියෙකු අද දින පරීක්ෂණයට සහභාගි වී නොමැත. ඒ අනුව මෙම තොරතුරු ඉල්ලීම ඉතා සැහැල්ලුවෙන් පොදු අධිකාරිය සළකා ඇති බව පෙනී යයි. ඉන් පෙනී යන්නේ තොරතුරු මුදා හැරීමේ හැකියාව ඉතා හොඳින් පොදු අධිකාරිය සතුව ඇති බවයි.

එබැවින් මෙම කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් 2022.10.19 දිනැති තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත සියලුම තොරතුරු 2022.12.12 දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට තීරණය කරමු.

එසේම, "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)" රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.



Right to Information Commission

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.

.....................................................
විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති

.....................................................
විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්

.....................................................
නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

.....................................................
නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

.....................................................
ඒ.එම් නහියා - කොමසාරිස්

TRUE COPY

22/11/09

on belf of the Admin officer